# බිම්මල් පාවඩ ඔස්සේ විශ්‍රාන්තිය සොයා

ඒ. එච්. රජිත

වත්මන වන විට විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරයකු වන සපුමල් බණ්ඩාර මීට වසර 40කට පෙර මව්පියන් නොමැති දරුවෙකු ලෙස තම මිත්තනියගේ නිවස තුළ හැදෙමින් වැඩෙමින් ලැබූ පන්නරයත් තම ලොකු අම්මාගේ හා මිත්තනියගේ අපහාස උපහාසවලට ලක් වෙමින් ලැබූ කටුක අත්දැකීමුත් තමන් වැදූ මව නොවූවත් තමන්ට ආදරය සෙනෙහස දක්වමින් තමන්ගේම මව මෙන් මුතු නැන්දා ආදරයෙන් තම ළමා විය තුළ දුෂ්කර ගමකදී සපුමල් ලැබූ විශ්‍රාන්තියන් පාදක කරගෙන ලියවුණ කෘතියක් ලෙස "බිම්මල් පාවඩ" කෘතිය හඳුනාගත හැකිය. ලලිත් රෝහණී එදිරිසිංහ විසින් රචනා කරන ලද මෙම කෘතිය පරිච්ඡේද 33 කින් හා පිටු 227කින් සමන්විත වේ.

බිම්මල් පාවඩ ඔස්සේ විශ්‍රාන්තිය සොයා...........ඇල ළඟ ගල් තලාවත්, ඇලෙන් එගොඩ වෙල්යායත්, දං, මාදං, හිඹුටු, පේර ගස් ලන්දත් තරම් සුරපුරක් මට නැත .........මම මුතු නැන්දාටත් වඩා වේගයෙන් ඔය මැද්දට පනිමි. මුතු නැන්දා ඔයෙහි ගිලෙන්නේ දියබුන් ගසමින් ය. අත් දෙක එකට එකතු කොට "බුංහ්" හඬක්.......... නිල් කැලටයක් සේ පැදුණු වතුර ඒ යටින් වූ සුදු වැලිතලාව උඩින් පීනා යන මාළු රංචු, ඔය ඉවුරු දිගට මල් පිපී ඇති වැටකේ පඳුරු, ඒ අස්සෙන් දිව යන කොරවක් පැටවු, ඔයට නැමී ඇති කුඹුක් අතු, මේ ඔය තුළදී මට අලුත් ලෝකයක් මවා දෙන්නා සේ ය..........විටෙක මම නිල් වතුර යටින් පීනා යමි. තව විටෙක ඔය පතුලට ම දෝත තබා වැලිගොව් පැටව් අල්ලමි..........මම එලෙස බලාගෙන මගේ සිතුවිලි නිදහසේ පා කර හරිමි..........සුළඟ හා මුසුව දැනෙන වැටකේ සුවඳ සිතට ගෙන එන්නේ ප්‍රබෝධයකි..........මම ගසේ හිද ඔයට පනිමි..........සුදුවැලි මිදුල පොල් අත්තේ රටාවට, එකම හැඩයට අතු ගෑ පසු මුළු නිවසටම ගෙන එන්නේ අපූරු සිරියාවකි..........
පිණි රැඳුණු තණපත් පෑගෙද්දී සිරුරම කිළිපොලා යන තරම් සීතලක් දැනේ. ඒ සීතලත් සමඟ නිදිමත, කම්මැලිකම පහව ගොස්, හිතට දැනෙන්නේ පුදුමාකාර ප්‍රබෝධයකි.........මම බිම ඉඳගෙන ඒ සේපාලිකා මල් සේරම එකතු කරමි.........මම පිල්කඩ උඩ වාඩි වී කුරුලු හඬට සවන්දීගෙනම ඒ සණ කළුවර දෙස ඔහේ බලා හිදිමි.........විවිධ හැඩයන්ට නිර්මාණය වී ඇති ගහ කොළ, අතු ඉති, ගල් කැට, කුරුලු පිහාටු, සමනල තටු වැනි පරිසරයේ වැටී ඇති බොහෝ දෑ ඔහු එකතු කළේය.........අපේ අයියා බට ලීවලින් තුවක්කු හදනවා.........හුදෙකලා වූ හැම අවස්ථාවකම ගහක පිපී ඇති කුඩා මලක්, බිම වැටී ඇති සමනල තටුවක් හෝ කුරුලු පිහාටුවක් නොවේ නම් විවිධ හැඩතලවල ගල් කැබැල්ලක්, ගහක කොළයක්, අත්තක් සොයමින් මම පිට්ටනිය දිගේ හෝ පාසල් වත්තේ තනි පන්ගලමේ ඇවිදිමි.........තමාගේ පොලු පහරකට සියඹලා පල්ලක් බිම වැටුන විට ලෝකයක් දෙපා මුලට වැටුණා තරම් හැඟීමකින් දිවගොස් එය අහුලාගෙන ආ හැටි බෝක්කු කන්ද උඩ ඉදගෙන අමු සියඹලාව සපා තලු මරමින් කා හැටි.........අතීතයේ තම කුඩා මිතුරා සමඟ එක් වී නටුවෙන් වැටුණු කැලෑ මලක්, බිම වැටුණු කුරුලු පිහාටුවක්, රටාවට හැදුණු අතු ඉති කැබැල්ලක්, රවුම් වී පැතලි වී දිලිසෙන ගල් කැබැල්ලක් වැනි යමක් අහුලාගෙන ඒ දෙස බලා ලැබූ ඒ සතුට.........
මඩේ එරි එරී එහේ මෙහේ යන්නට මම බෙහෙවින්ම ප්‍රිය කළෙමි.........මම දොතම දිය කඩිත්තට ඔබා මාළු පැටවුන් අල්ලාගෙන ගොස් ඇලට දමමි. මේ රතු පාට වූ ඉරත්, තැඹිලිපාට අහසත්, මොන තරම් අපූරුද? විටෙක දිය කාවන් රංචුනක් හෝ තනි වූ මා වවුලෙකු ඒ අහස් සීමාවෙන් පියඹා යන විට ඒ අපූරු බව තවත් වැඩිවෙයි.........ස්වභාදහමේ වූ මේ අපූරු බව මොන තරම් සජීවීද, කුරුල්ලන්ගේ ගී හඬ, සිහිල් සුළඟ, සීතල තුරු වියන, මල් පිපෙන ,එල දරන වනරොද සහිත මගේ අම්මා තනිවම නිදන මේ සීතල නිම්නය මොන තරම් සොඳුරුද.........ඉලුක් යාය පුරාම සුදු පැහැති මල් පිපී ඇත. ඉලුක් මල් සුළඟට සෙලවෙන්නේ අලුත් රටාවකටය.........මම ඉලුක් යාය පුරා දිව යමි. ඉලුක් පඳුරු අස්සේ හැංගී සිටින හාවුන්, මුගටීන් වැනි සතුන් කළබල වී ඒ මේ අත දිව යයි.........දම් පාටත්, සුදු පාටත් මිශ්‍ර වී සිහින් කෙඳි හැදී අපූරු මලක් ඒ විස කටු ගහේ හැදී පිපී ඇති පූරුව දෙස මම බලමි.........

එදිරිසිංහ ලලිත් රෝහිත(2013),බිම්මල් පාවඩ, පින්කොන් වත්ත, පොල්ගහහේන, රාගම, තාරා ප්‍රකාශන